පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
10

දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය ..........................................................

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි. කාලය : පැය 03 යි.

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✗) ලකුණ යොදන්න.**

- **පහත සඳහන් සිද්ධිය කියවා අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

නිලූකා නිවාස සැලසුම් ශිල්පය සම්බන්ධ පාඨමාලාවක් හදාරා ඒ පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබාගෙන ඇත. ලබාගත් දැනුම හා අත්දැකීම් උපයෝගී කරගෙන ව්‍යාපාරයක් ආරම්භ කළ යුතු යැයි සිතූ ඇය නගරයේ කඩ කාමරයක් මිලටගෙන "නිලූකා සැලසුම් ශිල්පයෝ " නමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

01. මෙම සිද්ධියේ සඳහන් "නිලූකා සැලසුම් ශිල්පයෝ " ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?
    (1) ආහාර (2) ඇඳුම්
    (3) නිවාස (4) ආරක්ෂාව

02. ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,
    (1) ව්‍යාපාරය නගරයේ පිහිටා තිබීම
    (2) ව්‍යාපාරයට ඉහළ ඉල්ලුමක් පැවතීම
    (3) නගරය තුළ වෙනත් තරඟකාරී ව්‍යාපාර පැවතීම
    (4) නිලූකා නිවාස සැලසුම් පාඨමාලාවක් හදාරා පුහුණුවක් ලබා තිබීම

03. මෙම සිද්ධියේ සඳහන් "නිලූකා සැලසුම් ශිල්පයෝ " ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
    (1) තනි ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර
    (3) සමාගම් (4) සමූපකාර

Education NCP - www.edncp.lk

04. "නිලූකා සැලසුම් ශිල්පයෝ " ව්‍යාපාරය අයත් ගොඩනැගිල්ල අයත් නිෂ්පාදන සාධකය වන්නේ,

(1) භූමිය (2) ශ්‍රමය

(3) ප්‍රාග්ධනය (4) ව්‍යවසාය

05. මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මෙය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.

(2) මෙය සේවා සැපයීමේ ව්‍යාපාරයකි.

(3) මෙම ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් ඇත.

(4) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචිය අනිවාර්යය නොවේ.

06. ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල පොදුවේ දැකිය **නොහැකි** අරමුණක් වන්නේ,

(1) ලාභ ඉපයීම

(2) පාරිභෝගික තෘප්තිය ලබාදීම

(3) සමාජ සුභසාධනය

(4) රැකියා උත්පාදනය

07. අවශ්‍යතාවල ලක්ෂණයක් වන්නේ,

(1) අත්‍යවශ්‍ය නොවීම (2) සංකීර්ණ වීම

(3) අසීමිත වීම (4) පොදු වීම

08. පහත දැක්වෙන ව්‍යාපාර අතරින් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් **නොවන්නේ**,

(1) මෝටර් රථ නිෂ්පාදන ව්‍යාපාරයකි.

(2) පරිගණක නිෂ්පාදන ව්‍යාපාරයකි.

(3) සිල්ලර වෙළෙඳ ආයතනයකි.

(4) යෝගට් නිෂ්පාදන ආයතනයකි.

09. සේවකයන් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව වන්නේ,

(1) ප්‍රමාණවත් ලාභයක් ලැබීමට

(2) සාධාරණ වැටුපක් ලබාගැනීමට

(3) දෙන ලද ණය අයකරගැනීමට

(4) තරගයට මුහුණදීමට

10. ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා සිදුවන හිතකර බලපෑම කුමක් ද?

(1) දැඩි තරගකාරිත්වයකට මුහුණ දීමට සිදු වීම

(2) දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම

(3) නවීන තාක්ෂණය ලබාගත හැකි වීම

(4) දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම

11. රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධානය කුමක් ද?

(1) හවුල් ව්‍යාපාර (2) දෙපාර්තමේන්තු

(3) සමූපකාර (4) සමිති සංවිධාන

Education NCP - www.edncp.lk

12. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී යොදාගනු ලබන ප්‍රමාණාත්මක සාධකයක් **නොවන්නේ,**
(1) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය
(2) සේවක සංඛ්‍යාව
(3) භාවිතා කරන බලශක්ති ප්‍රමාණය
(4) සේවක කැපවීම

13. හවුල් ව්‍යාපාරයක සිටින අවම හා උපරිම සාමාජික සංඛ්‍යාව සඳහන් වන පනත කුමක් ද?
(1) 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත
(2) 2007 අංක 7 දරණ සමාගම් පනත
(3) 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත
(4) 1972 සමූපකාර පනත

14. සමූපකාර ව්‍යාපාරවල පමණක් දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
(1) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම
(2) අඛණ්ඩ පැවැත්මක් තිබීම
(3) නෛතික පුද්ගලභාවයක් තිබීම
(4) කොටස් නිකුත් කර ප්‍රාග්ධනය රැස් කරගත හැකි වීම

15. වගකීම තමා මිලදීගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් සීමාවන ව්‍යාපාර සංවිධානය වන්නේ,
(1) තනි ව්‍යාපාර
(2) හවුල් ව්‍යාපාර
(3) සංස්ථාපිත සමාගම්
(4) සමූපකාර

16. යෝග්‍ය ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බලන කරුණක් **නොවන්නේ,**
(1) ව්‍යාපාරයේ අරමුණ
(2) ව්‍යාපාරයේ පරිමාණය
(3) කළමනාකරණ කටයුතු සිදු කරන්නේ කවුරුන් ද යන වග
(4) සේවක සංඛ්‍යාව

17. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,
(1) නීතිමය අවශ්‍යතා ඉටු කිරීමය.
(2) ව්‍යාපාරික ගනුදෙනු වාර්තා කිරීමය.
(3) ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීමය.
(4) උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීමය.

18. ගිණුම්කරණයේ දී සැලකිල්ලට **නොගන්නා** ගනුදෙනුවක් විය හැක්කේ,
(1) රු. 2 500 විදුලි ගාස්තු ගෙවීම
(2) රු. 4 000 ක් වටිනා භාණ්ඩ තොගයක් ගැනීම
(3) රු. 15 000 ක බැංකු ණයක් ලබාගැනීම
(4) සේවකයන් 3 දෙනෙකු බඳවාගැනීමට තීරණය කිරීම

Education NCP - www.edncp.lk

19. ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| වත්කම් (රු) | = | හිමිකම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|
| 100 000 | = | 70 000 | + | 30 000 |

පහත සඳහන් ගනුදෙනුව සිදුවීමෙන් පසුව ගිණුම්කරණ සමීකරණය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

රු. 25 000 ක බැංකු ණයක් ලබාගැනීම

| | වත්කම් (රු) | = | හිමිකම (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|---|
| (1) | 125 000 | = | 95 000 | + | 30 000 |
| (2) | 125 000 | = | 70 000 | + | 55 000 |
| (3) | 75 000 | = | 45 000 | + | 30 000 |
| (4) | 75 000 | = | 70 000 | + | 5 000 |

20. ව්‍යාපාරයක හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණය නිවැරදිව දැක්වෙන්නේ,

(1) වත්කම් - වගකීම්
(2) ආදායම් - වියදම්
(3) වත්කම් + වගකීම්
(4) ජංගම වත්කම් + ජංගම වගකීම්

21. පහත සඳහන් ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.

- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇති වීම
- ව්‍යාපාරයේ පාලනයට යටත් වීම
- අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම

ඉහත සඳහන් ලක්ෂණ දැකිය හැකි වන්නේ,

(1) වියදම් වලය.
(2) වත්කම් වලය.
(3) ආදායම් වලය.
(4) වගකීම් වලය.

22. ව්‍යාපාරයක මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේ දී ආදායම් ඉපයීමට දායක වූ වටිනාකම ගිණුම්කරණයේ දී හැඳින්වෙන්නේ,

(1) වගකීම් ලෙසය.
(2) වියදම් ලෙසය.
(3) වත්කම් ලෙසය.
(4) හිමිකම් ලෙසය.

23. ව්‍යාපාරයකට ගෙවල් කුලී ආදායමක් ලැබුණු විට එය ගිණුම්කරණ සමීකරණයට බලපාන්නේ,

(1) වත්කම් හා හිමිකම්වලට ය.
(2) වත්කම් හා වගකීම්වලට ය.
(3) වත්කම් හා වියදම්වලට ය.
(4) වත්කම් හා ගෙවල් කුලී ආදායම්වලට ය.

24. වැඩි වීම "බැර" අඩු වීම "හර" යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන්නේ,

(1) වත්කම් හා වියදම් ගිණුම්වලට ය.
(2) ආදායම් හා වියදම් ගිණුම්වලට ය.
(3) ආදායම් හා වගකීම් ගිණුම්වලට ය.
(4) වත්කම් හා හිමිකම් ගිණුම්වලට ය.

Education NCP - www.edncp.lk

25. වැඩි වීම "හර" අඩු වීම "බැර" යන ද්විත්ව සටහන් රීතිය අදාළ වන ගිණුම් වන්නේ,

(1) ණයහිමි ගිණුම හා ගැණුම් ගිණුම (2) ණයගැති ගිණුම හා විකුණුම් ගිණුම

(3) ණයගැති ගිණුම හා මුදල් ගිණුම (4) ණයහිමි ගිණුම හා බැංකු ණය ගිණුම

26. ව්‍යාපාරයේ අයිතිකරු ව්‍යාපාරයේ මුදල් තම පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමෙන් ඇතිවන ප්‍රතිඵලය වන්නේ,

(1) වත්කම් වැඩි වේ, හිමිකම වැඩි වේ. (2) වත්කම් අඩු වේ, හිමිකම අඩු වේ.

(3) වත්කම් අඩු වේ, වගකීම් අඩු වේ. (4) වත්කම් වැඩි වේ, වගකීම් වැඩි වේ.

27. ලෙජරය යනුවෙන් අදහස් කරනු ලබන්නේ,

(1) වත්කම් වැඩිවීම අඩුවීම සටහන් කරනු ලබන පොතයි.

(2) ව්‍යාපාරයක ගිණුම් සියල්ලම ඇතුළත් කරන පොතයි.

(3) ද්විත්ව සටහන් ක්‍රමයට අනුව ගනුදෙනු සටහන් කරන පොතයි.

(4) ව්‍යාපාරයක මුදල් සටහන් ඇතුළත් කරන පොතයි.

28. පොදු ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීමේ දී උපයෝගී කරගනු ලබන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

(1) විකුණුම් ඉන්වොයිසිය (2) ගැණුම් ඉන්වොයිසිය

(3) ජ'නල් වවුචරය (4) ගෙවීම් වවුචරය

29. පහත X තීරුවේ ගිණුම් වර්ග ද, Y තීරුවේ එම ගිණුම් සඳහා නිදසුන් ද දක්වේ.

| | X | | Y |
|---|---|---|---|
| 1 | ආදායම් ගිණුම් | A | ණය පොලී |
| 2 | හිමිකම ගිණුම | B | බැංකු ණය |
| 3 | වියදම් ගිණුම | C | විකුණුම් |
| 4 | වගකීම් ගිණුම | D | ගැනිලි |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග Y තීරුවේ සඳහන් නිදසුන් සමග අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර වනුයේ,

(1) 1A, 2B, 3C, 4D (2) 1C, 2D, 3A, 4B

(3) 1C, 2D, 3B, 4A (4) 1D, 2C, 3B, 4A

30. රු. 25 000 ක් වටිනා යන්ත්‍රයක් ණයට ලබාගැනීම

ඉහත ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ,

(1) වත්කම් පමණක් වෙනස් වේ. (2) වගකීම් පමණක් වෙනස් වේ.

(3) වත්කම් හා වගකීම් පමණක් වෙනස් වේ. (4) වත්කම් හා හිමිකම් පමණක් වෙනස් වේ.

31. ගැණුම් ජ'නලය,

(1) ගැණුම් ගිණුමකි. (2) ලෙජර් ගිණුමකි.

(3) මූලාශ්‍ර ලේඛනයකි. (4) මූලික සටහන් පොතකි.

Education NCP - www.edncp.lk

- **පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකි. ඒ ඇසුරෙන් අංක 32 සහ 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A අයිතිකරු ප්‍රාග්ධනය යෙදවීම රු. 100 000
B රක්ෂණ ගාස්තු ගෙවීම රු. 5 000
C අත්පිට මුදලට භාණ්ඩ ගැනීම රු. 10 000
D රු. 5 000 ක භාණ්ඩ තොගයක් රු. 6 000 කට විකිණීම

32. ඉහත සඳහන් ගනුදෙනු අතරින් හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු වන්නේ,
(1) A, C හා D ය. (2) B, C හා D ය.
(3) A, B හා D ය. (4) A, B හා C ය.

33. ඉහත ගනුදෙනු අවසානයේ වත්කම්වල වටිනාකමේ සිදු වූ වෙනස කොපමණ ද?
(1) රු. 96 000 (2) රු. 99 000
(3) රු. 110 000 (4) රු. 116 000

34. නිමල්ගේ ව්‍යාපාරයේ මූලික සටහන් පොත්වල සටහන් කර තිබූ ගනුදෙනු දෙකක් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| ණයගැතියන්ගෙන් ලැබීම් | රු. | 4 000 |
| අත්පිට ගැණුම් | රු. | 7 000 |

ඉහත ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීමේ දී භාවිතා කරන මූලාශ්‍ර ලේඛන පිළිවෙලින් දක්වෙන්නේ,
(1) විකුණුම් ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය
(2) ලදුපත, ගෙවීම් වවුචරය
(3) විකුණුම් ඉන්වොයිසිය, ගැණුම් ඉන්වොයිසිය
(4) ගෙවීම් වවුචරය, ලදුපත

35. සඳලිගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය රු. 75 000 ක් විය. පසුව පහත සඳහන් ගනුදෙනු සිදු වූ අතර එම ගනුදෙනු සිදුවීමෙන් පසු මුදල් ශේෂය වන්නේ,

| | | | |
|---|---|---|---|
| - | විදුලි ගාස්තු ගෙවීම | රු. | 5 000 |
| - | සමන්ට භාණ්ඩ විකුණුම් | රු. | 15 000 |
| - | පොලී ආදායම් ලැබුණා | රු. | 10 000 |
| - | භාණ්ඩ ගැනිලි | රු. | 3 000 |

(1) රු. 80 000 (2) රු. 85 000
(3) රු. 92 000 (4) රු. 95 000

Education NCP - www.edncp.lk

36. සිරිදාසගේ ව්‍යාපාරයට රු. 18 000 ක් වටිනා භාණ්ඩ තොගයක් මිලදී ගැනීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන,

(1) භාණ්ඩ තොග ගිණුම හර රු. 18 000
ණයහිමි ගිණුම බැර රු. 18 000

(2) ගැණුම් ගිණුම හර රු. 18 000
මුදල් ගිණුම බැර රු. 18 000

(3) භාණ්ඩ තොග ගිණුම හර රු. 18 000
මුදල් ගිණුම බැර රු. 18 000

(4) ගැණුම් ගිණුම හර රු. 18 000
ණයහිමි ගිණුම බැර රු. 18 000

37. ගුණසිරිගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ තොරතුරු කිහිපයක් පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| • ප්‍රාග්ධනය | රු. | 300 000 |
| • වර්ෂයේ වියදම් | රු. | 40 000 |
| • අමතර ප්‍රාග්ධනය | රු. | 30 000 |
| • ගැනිලි | රු. | 5 000 |
| • වර්ෂයේ ආදායම් | රු. | 70 000 |

2018.12.31 දිනට ගුණසිරිගේ හිමිකම වන්නේ,

(1) රු. 285 000
(2) රු. 290 000
(3) රු. 350 000
(4) රු. 355 000

38. ණයගැතියෙකුගෙන් රු. 15 000 ක චෙක්පතක් ලැබීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) බැංකු ගිණුම හර රු. 15 000
ණයගැති ගිණුම බැර රු. 15 000

(2) ණයගැති ගිණුම හර රු. 15 000
බැංකු ගිණුම බැර රු. 15 000

(3) මුදල් ගිණුම හර රු. 15 000
ණයගැති ගිණුම බැර රු. 15 000

(4) ණයගැති ගිණුම හර රු. 15 000
මුදල් ගිණුම බැර රු. 15 000

39. බැංකු ප්‍රකාශයේ ශේෂය, බැංකු ගිණුමේ ශේෂයට වඩා වැඩිවීමට බලපාන හේතුව වන්නේ මින් කුමක් ද?

(1) චෙක්පොත් ගාස්තු
(2) බැංකු ගාස්තු
(3) ණයගැති ප්‍රේෂණ
(4) තැන්පත් කර ඇති නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් අගය

40. රු. 25 000 ක යන්ත්‍රයක් ණයට ගැනීම සටහන් කරන මූලික සටහන් පොත වන්නේ,

(1) පොදු ජ'නලය
(2) විකුණුම් ජ'නලය
(3) ගැණුම් ජ'නලය
(4) මුදල් පොත

Education NCP - www.edncp.lk

❖ **පළමු ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය කියවා අංක (i) සිට (x) තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

සඳමාලි කරුණාරත්න අ.පො.ස. (උ. පෙළ) කෘෂි විෂය ධාරාව යටතේ විභාගයට මුහුණ දී රැකියාවක් අපේක්ෂාවෙන් පසුවන්නියකි. ඇගේ මව මල් වැවීම සඳහා දැඩි කැමැත්තක් දක්වන අතර නිවසේ අලංකාරය සඳහා විවිධ වර්ගයේ මල් පැළ විශාල සංඛ්‍යාවක් වගා කර ඇත. මෙම ගෙවත්තේ ඇති අලංකාරවත් බව නිසාම ප්‍රදේශයේ බොහෝ දෙනෙක් මල් පැළ මිලදී ගැනීමට ඇයගෙන් විමසුම් කරයි. නමුත් ව්‍යාපාරයක් වශයෙන් ඇය මල් වගා නොකරන නිසා මල් පැළ විකිණීම ඇය ප්‍රතික්ෂේප කරයි. කෙසේ වුවද ප්‍රදේශවාසීන්ගේ දැඩි අවස්ථාව හා ඉල්ලුම නිසා සඳමාලි, මෙම මල් වගාව ව්‍යාපාරයක් වශයෙන් කරගෙන යාමට අදහසක් පහළ විය.

ඒ අනුව 2018.01.01 දින මව ලබාදුන් රු. 200 000 මුදල යොදවමින් "සඳමාලි මල් පැළ" නමින් ව්‍යාපාරය ආරම්භ කරන ලදී. එදිනට රු. 10 000 මාසික වැටුපක් ලබාදීමේ පොරොන්දුව මත සේවකයන් දෙදෙනෙක් ද බඳවා ගන්නා ලදී. ව්‍යාපාරයේ සිදු වූ තවත් ගනුදෙනු පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 2018.01.03 | මල් බීජ මිලදී ගැනීම | රු. | 10 000 |
| 2018.01.05 | මල් පැළ මිලදී ගැනීම | රු. | 20 000 |
| 2018.01.07 | මල් පැළ විකිණීම (අත්පිට) | රු. | 50 000 |
| 2018.01.10 | පොහොර මිලදී ගත්තා | රු. | 5 000 |
| 2018.01.12 | මල් පැළ ණයට ගැණුම් | රු. | 10 000 |
| 2018.01.15 | බීජ ණයට ගැණුම් | රු. | 3 000 |
| 2018.01.16 | මල් පෝච්චි මිලට ගත්තා | රු. | 20 000 |
| 2018.01.25 | බැංකු ණයක් ගත්තා | රු. | 500 000 |
| 2018.01.25 | කුඩා ලොරි රථයක් මිලට ගත්තා | රු. | 500 000 |

(i) ඉහත සිද්ධියට අනුව "සඳමාලි මල් පැළ" ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) මෙම සිද්ධියට අදාළව සඳමාලි සතු ශක්තීන් මොනවා ද?

(iii) "සඳමාලි මල් පැළ" ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.

(iv) "සඳමාලි මල් පැළ" ව්‍යාපාරය ආරම්භ කිරීමට මුල් වූ ප්‍රධානම හේතුව කුමක් ද?

(v) මෙම සිද්ධියට අදාළව 2018.01.01 දිනට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.

(vi) බැංකු ණය ලබාගැනීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(vii) සඳමාලි විසින් පවත්වාගෙන යා යුතු මූලික පොත් දෙකක් ලියා දක්වන්න.

(viii) 2018 ජනවාරි මාසයට අදාළ අත ඉතිරි ශේෂය ගණනය කරන්න.

(ix) සිද්ධියට අදාළව සඳමාලි ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කමක් නම් කරන්න.

(x) මෙම ව්‍යාපාරයේ ඇති ජංගම නොවන වගකීම්වල අගය කොපමණ ද?

**(ලකුණු 2 × 10 = 20)**



Education NCP - www.edncp.lk

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) ව්‍යාපාර සංකල්පය පැහැදිලි කරන්න.

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ඕනෑම ව්‍යාපාරයක මූලික අරමුණ ලාභ ඉපයීමයි.

(ආ) අත්‍යවශ්‍ය වීම අවශ්‍යතාවල ලක්ෂණයකි.

(ඉ) වුවමනා පුද්ගලයා අනුව වෙනස් වේ.

(ඊ) රූපලාවන්‍ය ආයතනයක් සේවා සපයන ආයතනයකි.

(iii) නිෂ්පාදන සාධක නම් කරන්න.

(iv) ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයක් වන මූල්‍ය ආයතන ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

**(ලකුණු 2 × 4 = 8)**

03. (i) ව්‍යාපාර පරිසරය වර්ග කර, ඊට අයත් උප අංශ දෙක බැගින් නම් කරන්න.

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) භාණ්ඩ හා සේවා අලෙවියේ දී තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම උද්ධමනයයි.

(ආ) ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම ව්‍යාපාරයක ශක්තියකි.

(ඉ) යුරෝපා රටවල භාවිතා වන පොදු මුදල් ඒකකය යුරෝ ය.

(ඊ) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර පොදු හා පෞද්ගලික ලෙස වර්ග කළ හැකි ය.

(iii) ව්‍යාපාරයක ඇති ශක්තීන් හා දුර්වලතා දෙක බැගින් ලියන්න.

(iv) විදේශ විනිමය අනුපාතිකය යනු කුමක් ද?

**(ලකුණු 2 × 4 = 8)**

04. (i) හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ආකාරය ගැලීම් සටහනකින් දක්වන්න.

(ii) පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සමූපකාර සමිති පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාරයකි.

(ආ) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හඳුන්වා දෙන පරිදි සේවක සංඛ්‍යාව 25 අඩු ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ.

(ඉ) හවුල් ව්‍යාපාර සඳහා නෛතික පුද්ගලභාවයක් ඇත.

(ඊ) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම සමූපකාර ව්‍යාපාරවල ලක්ෂණයක් නොවේ.

(iii) හවුල් ගිවිසුම යනු කුමක් ද?

(iv) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයකට අත්වන වාසි දෙකක් ලියන්න.

**(ලකුණු 2 × 4 = 8)**

Education NCP - www.edncp.lk

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

05. (i) ව්‍යාපාර ගනුදෙනු යනු කුමක්දැයි සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) නන්දනගේ ව්‍යාපාරයේ 2019.03.01 දිනට පැවති වත්කම්, වගකීම්, හිමිකම් හා ශේෂ සහ මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණය යටතේ සටහන් කර තිබූ ආකාරය පහත දැක්වේ.

| | | වත්කම් (රු) | = | හිමිකම් (රු) | + | වගකීම් (රු) |
|---|---|---|---|---|---|---|
| 2019.03.01 | ශේෂය | 150 000 | = | 120 000 | | 30 000 |
| | (1) | +8 000 (ණයගැතියෝ) | | +1 000 (ලාභය) | | |
| | | -7 000 (බඩු තොගය) | | | | |
| | (2) | +15 000 (මුදල්) | | - | | +15 000 (බැංකු ණය) |
| | (3) | - | | +3 000 | | -3 000 (ණයහිමියෝ) |
| | (4) | -4 000 (මුදල්) | | -4 000 (විදුලි ගාස්තු) | | - |

**අවශ්‍ය වන්නේ,**

ඉහත එක් එක් ගනුදෙනුව වටිනාකම් සහිතව ලිවීම (ලකුණු 04)

(iii) සුගත්ගේ ව්‍යාපාරයේ ජනවාරි මුල් සති දෙක තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 2019.01.01 | මුදල් ශේෂය | රු. | 25 000 |
| 2019.01.03 | මුදලට ගැණුම් | රු. | 10 000 |
| 2019.01.04 | බැංකු ණයක් ගත්තා | රු. | 40 000 |
| 2019.01.05 | මුදලට විකුණුම් | රු. | 5 000 |
| 2019.01.06 | ලී බඩු මුදලට ගැනීම | රු. | 15 000 |
| 2019.01.08 | විදුලි ගාස්තු ගෙව්වා | රු. | 4 000 |
| 2019.01.09 | ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා | රු. | 2 000 |
| 2019.01.11 | සුගත් පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ගත්තා | රු. | 1 000 |
| 2019.01.12 | මුදලට විකුණුම් | රු. | 2 000 |
| 2019.01.14 | බැංකු ණය ගෙවීම | රු. | 4 000 |

**අවශ්‍ය වන්නේ,**

සුගත්ගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කිරීම (ලකුණු 06)

Education NCP - www.edncp.lk

06. (i) (අ) වගකීමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

(ආ) බැංකු අයිරාවක් යනු කුමක් ද? (ලකුණු 04)

(ii) ධනපාලගේ ව්‍යාපාරයේ 2019.01.01 දිනට පැවති වත්කම් හා වගකීම්වල ශේෂයන් පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| මුදල් | 75 000 | ණයහිමි | 40 000 |
| ඉඩම් | 500 000 | බැංකු ණය | 100 000 |
| ණයගැති | 25 000 | බැංකු අයිරාව | 10 000 |
| මෝටර් රථ | 700 000 | ගෙවිය යුතු වියදම් | 30 000 |
| බඩු තොග | 20 000 | | |

(අ) ධනපාලගේ ව්‍යාපාරයේ 2019.01.01 දිනට පැවති මුළු වත්කම්වල වටිනාකම කොපමණද?

(ආ) මෙම ව්‍යාපාරයේ 2019.01.01 දිනට ජංගම වගකීම්වල වටිනාකම සඳහන් කරන්න.

(ඉ) ධනපාලගේ 2019.01.01 දිනට ජංගම නොවන වගකීම්වල අගය ලියන්න.

(ඊ) මෙම ව්‍යාපාරයේ 2019.01.01 දිනට අයිතිකරුගේ හිමිකම ලියන්න. (ලකුණු 04)

(iii) විහගගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමට අදාළ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. බැංකුවේ මුදල් තැන්පත් කිරීම රු. 20 000
2. ණයගැතියෙකුගෙන් ලැබුණ රු. 4 000 ක චෙක්පත එදිනට බැංකුගත කිරීම
3. රක්ෂණ වාරිකය චෙක්පතකින් ගෙවීම රු. 3 000
4. ණයහිමියෙකුට නිකුත් කළ රු. 6 000 ක චෙක්පත අගරු වීම

ඉහත සඳහන් ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලියන්න. (ලකුණු 04)

07. (i) බැංකුවක් විසින් චෙක්පතක් ප්‍රතික්ෂේප කරන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛන සහ මූලික පොත් ලියා දක්වන්න.

| | ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛන | මූලික පොත |
|---|---|---|---|
| A | සේවක වැටුප් ගෙව්වා රු. 15 000 | | |
| B | නිමල්ගෙන් භාණ්ඩ ගත්තා රු. 3 000 | | |
| C | රක්ෂණ ගාස්තු චෙක්පතකින් ගෙව්වා රු. 6 000 | | |
| D | අත්පිට විකුණුම් රු. 4 000 | | |
| E | සුනිල්ට භාණ්ඩ විකුණුම් රු. 7 000 | | |

(ලකුණු 05)

Education NCP - www.edncp.lk

(iii) 2018 දෙසැම්බර් 31 දින ලසන්තගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 8 000 ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වෙනස් විය. වෙනසට හේතු මෙසේ ය.

- තැන්පත් කළ නමුත් දෙසැම්බර් මාසය තුළ උපලබ්ධි නොවූ චෙක්පත් රු. 10 000 කි.
- නිකුත් කළ නමුත් දෙසැම්බර් මාසය තුළ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 7 500 කි.
- ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවට ඍජුවම ලැබී ඇති ලාභාංශ රු. 2 000 කි.
- බැංකුව විසින් අය කර ඇති ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කර නැති බැංකු ගාස්තු රු. 1 000 ක් හා ස්ථාවර නියෝග මත ගෙවූ රක්‍ෂණ ගාස්තු රු. 3 000 ක් විය.

**අවශ්‍ය වන්නේ,**

(අ) 2018.12.31 දිනට බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2018.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම (ලකුණු 05)

Education NCP - www.edncp.lk

***

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II

**10 ශ්‍රේණිය** **දෙවන වාර පරීක්ෂණය - 2019**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

## ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01 | (3) | 21 | (2) |
| 02 | (4) | 22 | (2) |
| 03 | (1) | 23 | (1) |
| 04 | (3) | 24 | (3) |
| 05 | (2) | 25 | (3) |
| 06 | (3) | 26 | (2) |
| 07 | (4) | 27 | (2) |
| 08 | (3) | 28 | (3) |
| 09 | (2) | 29 | (2) |
| 10 | (3) | 30 | (3) |
| 11 | (2) | 31 | (4) |
| 12 | (4) | 32 | (3) |
| 13 | (2) | 33 | (1) |
| 14 | (1) | 34 | (2) |
| 15 | (3) | 35 | (1) |
| 16 | (4) | 36 | (2) |
| 17 | (4) | 37 | (4) |
| 18 | (4) | 38 | (3) |
| 19 | (2) | 39 | (3) |
| 20 | (1) | 40 | (1) |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

## ලකුණු දීමේ පටිපාටිය

01. (i) ඒක පුද්ගල/ තනි පුද්ගල/ තනි ව්‍යාපාරයකි. **(ලකුණු 02)**

(ii)
- කෘෂි විෂය ධාරාව යටතේ අධ්‍යාපනය ලැබීම.
- මව මල් වගාවේ නියැලී සිටීම.
- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම. **(ලකුණු 02)**

(iii) ඔව්, සඳමාලිගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමක් යොදාගෙන ඇති නිසා 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනතට අනුව ලියාපදිංචි කළ යුතුය. (පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව)

(පනතේ අංකය සඳහන් නොවූවද ලකුණ දෙන්න) **(ලකුණු 01)**

(iv) ප්‍රදේශවාසීන්ගේ ඉහළ ඉල්ලුමක් පැවතීම.

(v)

| **වත්කම්** | = | **හිමිකම්** | + | **වගකීම්** |
|---|---|---|---|---|
| + 200 000 (මුදල්) | = | + 200 000 (ප්‍රාග්ධනය) | | |
| + 200 000 | = | + 200 000 | | - |

**(ලකුණු 02)**

(vi) මුදල් ගිණුම / පොත හර බැංකු ණය ගිණුම බැර

(vii) මුදල් පොත, ගැණුම් ජර්නලය **(ලකුණු 02)**

(viii) හර මුදල් පොත බැර

| දිනය | විස්තරය | ස පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 18.1.1 | ප්‍රාග්ධනය | | 200 000 | 18.1.3 | බීජ මිලදී ගැනීම | | 10 000 |
| 18.1.7 | මල් පැල විකිණීම | | 50 000 | 18.1.5 | මල් පැල මිලදී ගැනීම | | 20 000 |
| 18.1.25 | බැංකු ණය | | 500 000 | 18.1.10 | පොහොර සඳහා | | 5 000 |
| | | | | 18.1.16 | මල් පෝච්චි මිලට ගැනීම | | 20 000 |
| | | | | 18.1.25 | ලොරි ගිණුම | | 500 000 |
| | | | | 18.1.30 | ප/ගෙ ශේෂය | | 195 000 |
| | | | 750 000 | | | | 750 000 |
| 18.2.1 | ඉ/ගෙ ශේෂය | | 195 000 | | | | |

**(ලකුණු 02)**

(ix) කුඩා ලොරි රථය **(ලකුණු 02)**

(x) රු. 500 000 /- **(ලකුණු 02)**

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වූ විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. **(ලකුණු 02)**

(ii) (අ) අසත්‍ය (ආ) සත්‍ය

(ඉ) සත්‍ය (ඊ) සත්‍ය

(iii) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය

(iv)
- ණය මුදල් ලබා දීම සඳහා
- ලබාදුන් ණය ආපසු අය කර ගැනීමට **(ලකුණු 02)**

03. (i) ව්‍යාපාර පරිසරය

**අභ්‍යන්තර**
- අයිතිකරු
- සේවකයන්
- කළමනාකරුවන්

**බාහිර**
- ගනුදෙනුකරුවන්
- සැපයුම්කරුවන්
- තරගකරුවන්
- දේශපාලන පරිසරය
- නෛතික පරිසරය
- තාක්ෂණික පරිසරය
- ආර්ථික පරිසරය
- ගෝලීය පරිසරය

**(පරිසරය වෙන් කර දැක්වීම ලකුණු 01)**
**(උප සාධක දැක්වීමට ලකුණු 01)**

(ii) (අ) සත්‍ය (ආ) සත්‍ය

(ඉ) සත්‍ය (ඊ) සත්‍ය

(iii) **ශක්තීන්**
- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම
- කළමනාකරණ අත්දැකීම්
- සේවකයින්ගේ කැපවීම හා දැනුම
- සුවිශේෂී නිෂ්පාදන ක්‍රම
- පිළිගත් සන්නම් නාමයක් තිබීම **(කරුණු 2 ක් සඳහා ලකුණු 01)**

**දුර්වලතා**
- අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නොවීම
- පුහුණු සේවක හිඟය
- තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම
- සේවකයන්ගේ අයහපත් ආකල්ප
- භූගෝලීය පිහිටීම දුර්වල වීම **(කරුණු 2 ක් සඳහා ලකුණු 01)**

(iv) යම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමඟ හුවමාරු වන අනුපාතයයි. **(ලකුණු 02)**

04. (i)

ව්‍යාපාර

**පෞද්ගලික**

- කේවල ස්වාමි
- හවුල් ව්‍යාපාර
- පෞද්ගලික සමාගම්
- සමූපකාර
- සමිති

**(ලකුණු 01)**

**පොදු**

- මධ්‍යම රජය
- පළාත් සභා
- පළාත් පාලන ආයතන

**(ලකුණු 01)**

(ii) (අ) සත්‍ය (ආ) සත්‍ය

(ඉ) අසත්‍ය (ඊ) අසත්‍ය

(iii) හවුල්කරුවන් අතර ඇති කර ගන්නා එකඟතාවයයි. **(ලකුණු 02)**

(iv)
- අනන්‍යතාවයක් ලැබීම
- ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම
- රජයෙන් ලැබෙන දිරිගැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම
- ණය ලබාගැනීමේ දී පහසුවක් ලැබීම **(කරුණු 2 ක් සඳහා ලකුණු 02)**

05. (i) ව්‍යාපාරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරු වීම. **(ලකුණු 02)**

(ii)
1. රු. 7 000 ක් වටිනා බඩු තොගය රු. 8 000 කට ණයට විකිණීම.
2. රු. 15 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
3. අයිතිකරුගේ මුදලින් රු. 3 000 ක් ණයහිමියන්ට ගෙවීම.
4. රු. 4 000 ක විදුලි ගාස්තු ගෙවීම. **(ලකුණු 04)**

(iii)

මුදල් පොත

| දිනය | ල. අං | විස්තරය | ස පි | වටිනාකම (රු.) | දිනය | ව. අං | විස්තරය | ස පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01.01 | | ශේෂය ඉ/ගෙ | | 25 000 | 01.02 | | ගැණුම් | | 10 000 |
| 01.04 | | බැංකු ණය | | 40 000 | 01.06 | | ලී බඩු | | 15 000 |
| 01.05 | | විකුණුම් | | 5 000 | 01.08 | | විදුලි ගාස්තු | | 4 000 |
| 01.09 | | ණයගැති | | 2 000 | 01.11 | | ගැනිලි | | 1 000 |
| 01.12 | | විකුණුම් | | 2 000 | 01.14 | | බැංකු ණය | | 4 000 |
| | | | | | | | ශේෂය ප/ගෙ | | 40 000 |
| | | | | 74 000 | | | | | 74 000 |
| 01.15 | | ශේෂය ඉ/ගෙ | | 40 000 | | | | | |

06. (i) (අ)
- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම
- බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම.
- වර්තමාන බැදීමක් පැවතීම. **(ලකුණු 01)**

(ආ) ජංගම ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට බැංකුව එම චෙක්පත් වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගය **(ලකුණු 01)**

(ii) (අ) රු. 1 320 000 (ආ) රු. 80 000

(ඉ) රු. 100 000 (ඊ) රු. 1 140 000 **(ලකුණු 04)**

(iii) 1. බැංකු ගිණුම හර රු. 20 000
මුදල් පොත බැර රු. 20 000

2. බැංකු ගිණුම හර රු. 4 000
ණයගැති ගිණුම බැර රු. 4 000

3. රක්‍ෂණ ගිණුම හර රු. 3 000
බැංකු ගිණුම බැර රු. 3 000

4. බැංකු ගිණුම හර රු. 6 000
ණයහිමි ගිණුම බැර රු. 6 000

07. (i)
- චෙක්පත් අවිධිමත් ව ලියා තිබීම.
- ජංගම ගිණුමේ මුදල් නොතිබීම.
- ආදර්ශ අත්සන වෙනස් වීම. **(ලකුණු 02)**

(ii)

| | **මූලාශ්‍ර ලේඛනය** | | **මූලික පොත** |
|---|---|---|---|
| A | ගෙවීම් වවුචරය | - | මුදල් පොත |
| B | ගැනුම් ඉන්වොයිසිය | - | ගැනුම් ජර්නලය |
| C | පිළිපත / ගෙවීම් වවුචරය | - | බැංකු ගිණුම |
| D | ලදුපත | - | මුදල් පොත |
| E | විකුණුම් ඉන්වොයිසිය | - | විකුණුම් ජර්නලය |

**(ලකුණු 05)**

(iii)

සංශෝධිත බැංකු ගිණුම

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ඉ/ගෙ ශේෂය | | 8 000 | | බැංකු ගාස්තු | | 1 000 |
| | ලාභාංශ | | 2 000 | | රක්‍ෂණ ගාස්තු | | 3 000 |
| | | | | | ප/ගෙ ශේෂය | | 6 000 |
| | | | 10 000 | | | | 10 000 |
| | ඉ/ගෙ ශේෂය | | 6 000 | | | | |

**(ලකුණු 2 1/2)**

බැංකු සැසඳුම් විස්තරය


| | | | |
|---|---|---|---|
| 2018.12.31 දිනට සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය | | 6 000 | ල. 1/2 |
| <u>**එකතු කළා**</u> | | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | | 7 500 | ල. 1/2 |
| | | 135 500 | ල. 1/2 |
| <u>**අඩු කළා**</u> | | | |
| තැන්පත් කළත් උපලබ්ධි නොවූ චෙක් | | (10 000) | ල. 1/2 |
| **2018.12.31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය** | ල. 1/2 | 3 500 | **(ලකුණු 2 1/2)** |


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
**Learn Ordinary Level**


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371











































# LOL.lk online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්වා ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal

NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE BOOK STORE

An evening of fun for young readers